# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2153/13 - 2019 දෙසැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2019.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය )**

**7 වන වගන්තිය යටතේ දැන්වීම**

මගේ අංකය :- DS/GFG/L&L/5/133
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය අංකය : 4-3/16/2018/UD/457

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගාල්ල මහ නගර සභා සීමාව තුළ 101A, දෙද්දුගොඩ දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දෙද්දුගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 810024 දරන කැඩැස්තර පිඹුරේ, කලාප අංක 02හි පත්‍ර අංක 30හි කැබලි අංක 1077,1078 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0029 ක් වූ පහත නම් වලින් හා මායිම්වලින් යුත් බිම් කොටස් සඳහා මායිම් :

**කැබලි අංක 1077**

ඉඩමේ නම: මහමොරගොඩවත්ත, වරිපනම් අංක - සොයාගත නොහැක, හිමිකම් කියන අය: රජය, ඉඩම් පරිහරණය: ගෙවත්ත තාප්පයකින් කොටසක් ඇත, මුල් හිමිකම් පාන්නා: ඩී.පී.වයි. ගමගේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0015 ක් පමණ වේ.

**කැබලි අංක 1078**

ඉඩමේ නම: මහමොරගොඩවත්ත, වරිපනම් අංක - 118/4, හිරිඹුර හරස් පාර, හිමිකම් කියන අය: රජය, ඉඩම් පරිහරණය: ගෙවත්ත තාප්පයකින් කොටසක් ඇත, මුල් හිමිකම් පාන්නා: බටපොල ගමගේ උදය කසුන්, ප්‍රමාණය: හෙක්ටයාර් - 0.0014 ක් පමණ වේ.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.12.23 වැනි දින පූ.භා. 9.00 ට ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019.12.16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයි. හිමාලි රත්නවීර,
ප්‍රාදේශීය ලේකම්,
කඩවත්සතර - ගාල්ල.

ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.
2019.12.06

12—889/1

## ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

## 7 වන වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය :- DS/GFG/L&L/5/133
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය අංකය : 4-3/16/2018/UD/457

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දි සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර -

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගාල්ල මහ නගර සභා සීමාව තුළ 97D , දංගෙදර නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දංගෙදර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 810025 දරන කැඩැස්තර පිඹුරේ, කලාප අංක 01හි පත්‍ර අංක 06හි කැබලි අංක 422,423,425,427 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0083 ක් වූ පහත නම් වලින් හා මායිම්වලින් යුත් බිම් කොටස් සඳහා මායිම්:

**කැබලි අංක 422**

ඉඩමේ නම: කුරුඳුවත්තපස්හවුලඹිවිට, පස්හවුලඹිවිට *හෙවත්* කුරුඳුවත්තඅද්දර මහලියද්ද සහ කුකලානෙඹිවිට, හිමිකම් කියන අය: රජය ,ඉඩම් පරිහරණය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත, මුල් හිමිකම් පාන්නා: සජිත් දයාරත්න, ප්‍රමාණය: හෙක්ටයාර් 0.0040 ක් පමණ වේ.

**කැබලි අංක 423**

ඉඩමේ නම: කුරුඳුවත්තපස්හවුලඹිවිට, පස්හවුලඹිවිට *හෙවත්* කුරුඳුවත්තඅද්දර මහලියද්ද සහ කුකලානෙඹිවිට, හිමිකම් කියන අය: රජය, ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත, මුල් හිමිකම් පාන්නා: හේවා මාරඹගේ ධර්මසේන, ප්‍රමාණය: හෙක්ටයාර් - 0.0013ක් පමණ වේ.

**කැබලි අංක 425**

ඉඩමේ නම: නැත, හිමිකම් කියන අය: රජය, ඉඩම් පරිහරණය: මාර්ගය, මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක, ප්‍රමාණය: හෙක්ටයාර් - 0.0010 ක් පමණ වේ.

**කැබලිඅංක 427**

ඉඩමේ නම: කුරුඳුවත්තපස්හවුලඹිවිට, පස්හවුලඹිවිට *හෙවත්* කුරුඳුවත්තඅද්දර මහලියද්ද, වැල්ලඹගලඇලඅද්දර ඹිවිට සහ කුකුලානෙඹිවිට, හිමිකම් කියන අය: රජය, ඉඩම් පරිහරණය: ගෙවත්ත මිශ්‍ර බෝග වගාවක් ඇත, මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක, ප්‍රමාණය: හෙක්ටයාර් - 0.0020 ක් පමණ වේ.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2019.12.23 වැනි දින පෙ.ව. 9.00ට ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019.12.16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයි. හිමාලි රත්නවීර,
ප්‍රාදේශීය ලේකම්,
කඩවත්සතර - ගාල්ල.

ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.
2019.12.06

12—889/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.